චක්‍රලේඛ අංක 63/2012

මගේ අංකය - දපස/නීති/චක්‍ර
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත,
සැලසුම් ලේකම් කාර්යාලයීය
ගොඩනැගිල්ල, ( 1 වන මහල),
එස්.එච්.දහනායක මාවත,
ගාල්ල.
2012.04.04

දකුණු පළාතේ සියලුම සමූපකාර
සමිතිවල සභාපතිවරුන් වෙත,

දකුණු පළාතේ සමූපකාර සේවකයින්ට අතිරේක දීමනාවක් ගෙවීම.
--------------------------------------------------------

දකුණු පළාතේ සමූපකාර සේවක කොමිෂන් සභාව අවසන් වරට සමූපකාර සේවකයින්ට වැටුප් වැඩි කිරීමක් සිදු කරන ලද්දේ 2008 වසරේදීය. රජයේ සේවකයින්ට වරින් වර කීප අවස්ථාවකදී අයවැය යෝජනා අනුව වැටුප් හා දීමනා වැඩි කිරීම් සිදු කර ඇත. රටේ ජීවන වියදම ඉහළ මට්ටමක පැවතීම සමූපකාර සේවකයින්ට ද දැඩිව බලපා ඇති බැවින්, ඔවුන්ගේ දැඩි ඉල්ලීම් කෙරෙහි සලකා බලා, දකුණු පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස්ගේ නිර්දේශ පිළිබඳව ද අවධානය යොමු කර, දකුණු පළාතේ සියලුම සමූපකාර සමිතිවල සේවය කරන ස්ථිර, තාවකාලික, අනියම්, සේවකයින් සියලු දෙනාට වැටුපට අමතරව රු.1500/- ක අතුරු දීමනාවක් ගෙවිය යුතුය. දෛනික වැටුප් ලබන සේවකයින්ට මෙම දීමනාව ගෙවීමේදී වැඩ කළ දින ගණන දින 21 ට වඩා වැඩි නම් සම්පූර්ණ දීමනාව ද, දින 21 ට වඩා අඩු නම් වැඩ කළ දින ගණන පදනම් කරගෙන ද මෙම දීමනාව ගෙවිය යුතු බවට කොමිෂන් සභාවේ නියෝගය පරිදි මෙයින් දන්වමි.

02. මෙම අතිරේක දීමනාව ගෙවීම 2012.01.01 දින සිට ක්‍රියාත්මක කළ යුතුය.

03. මෙම දීමනාව ගෙවීමෙන් සියලුම සමූපකාර සමිතිවලට වැඩිපුර දැරීමට සිදුවන මුදල් පාලක හා සේවක දෙපක්ෂය එක්ව නව ව්‍යාපෘති හා පවතින ව්‍යාපාරික කටයුතු කාර්යක්ෂමව මෙහෙයවීම මත පාලනය කර ගත යුතු බවත් දන්වමි.

04. මෙම අතිරේක දීමනාව සමූපකාර සේවකයින්ගේ විශ්‍රාම පාරිතෝෂික දීමනා, සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක කර නොගත යුතු බව ද දන්වමි.

......2

05. තව ද, මෙම චක්‍රලේඛය ඔබ සමිතියේ සියලුම සේවකයින්ට දැන ගැනීමට සැලැස්විය යුතු අතර, නියමිත දින සිට ගෙවීම් කළ යුතු බවට ද අවධාරණය කරමි.

06. තව ද, මීට අමතර වශයෙන් කොමිෂන් සභාව තීරණය කරනුයේ සමහර සමූපකාර සමිති දැනටමත් ස්වකීය සේවකයින්ගේ සුභසාධනය උදෙසා ඉහත සඳහන් රු.1500/- දීමනාවට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් ගෙවීමට කොමිෂන් සභාවට කරන ලද ඉල්ලීම් ද සලකා බලන ලදී. එහිදී යම් සමූපකාර සමිතියකට ඉහත සඳහන් රු.1500/- දීමනාවට වඩා වැඩි මුදලක් සමිතියේ ලාභ අලාභ පදනම් කරගෙන ගෙවීමට හැකියාවක් ඇත්නම්, එම මුදල කොපමණද? යන්න තීරණය කර, සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතර කැමැත්ත මත කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ද ලබා ගැනීමෙන් අනතුරුව, එවැනි යම් මුදලක් ගෙවීමට මෙම චක්‍රලේඛය බාධාවක් නොවන බවට ද වැඩිදුරටත් තීරණය කර ඇති බව දන්වමි.

ඒ/ත. පී.ගමගේ.
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත් -1. ලේකම් - ධීවර, සංස්කෘතික, සමූපකාර .... අමාත්‍යාංශය - දැ.ස.

2. ස.සං.කො/රෙ ( දකුණු පළාත) - දැ.ස.

3. දිවයිනේ පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන් - දැ.ස.

4. ද.ප.ස. චක්‍රලේඛ ගොනුවට.

ලේකම්
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.